# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2058/34 - 2018 පෙබරවාරි මස 15 වැනි බ්‍රහස්පතින්දා - 2018.02.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත**

3 වැනි වගන්තිය යටතේ නියමය

1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය මංගල සමරවීර වන මම, මෙම නියෝගය මගින්

(අ) එම වගන්තිය යටතේ පනවන ලද 2017.11.09 වැනි දිනැති අංක 2044/32 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරන ලද උපලේඛනය (II) හි සඳහන් අයිතම අංක 1 (ආ) හා 1 (ඇ) පහත උපලේඛනය අ පරිදි ද ; සහ

(ආ) එම වගන්තිය යටතේ පනවන ලද 2017.11.28 වැනි දිනැති අංක 2047/25 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරන ලද අයිතම අංක 01 හා 02 පහත උපලේඛනය ආ පරිදි ද ;

සංශෝධනය කරමි.

මෙම නියෝගය 2018 පෙබරවාරි මස 16 වැනි දා සිට ක්‍රියාත්මක වේ.

මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය.

2018 පෙබරවාරි මස 15 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය අ**

| *අංකය* | *විස්තරය* | *නිෂ්පාදන බද්ද* |
|---|---|---|
| (ආ) | රජයේ නිලධාරියකු විසින් 2018.02.15 දිනැති වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2018 ට අනුව නිකුත් කරන ලද සහනදායී බලපත්‍රයක් උපයෝගී කරගෙන, | ගෙවිය යුතු බදු ප්‍රමාණයෙන් රු. මිලියන 5.0 ක් අඩු කිරීම |
| (ඇ) | විදේශ දූත මණ්ඩලයන්හි සේවය කරන ශ්‍රී ලාංකික තානාපති නිලධාරීන් විසින් 2016.10.31 දිනැති අංක 210(III) දරන චක්‍රලේඛය හෝ/සහ එයට යා කරන ලද සංශෝධන වලට අනුව විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් උපයෝගී කරගෙන, | ගෙවිය යුතු බදු ප්‍රමාණයෙන් රු. මිලියන 5.0 ක් අඩු කිරීම |


1A - PG 3920 — 557 (2018/02)



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උපලේඛනය ආ

| අංකය | විස්තරය | නිෂ්පාදන බද්ද |
|---|---|---|
| 02. | රජයේ නිලධාරියකු විසින් 2016.07.14 දිනැති වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2016 ට අනුව නිකුත් කරන ලද බලපත්‍රයක් උපයෝගී කරගෙන, 2017.11.09 දින හෝ ඊට පෙර ණයවර ලිපිය විවෘත කර ආනයනය කරන ලද සහ 2018.04.30 දින හෝ ඊට පෙර ශ්‍රී ලංකා රේගුවෙන් නිෂ්කාශනය කර ගන්නා ලද වාහනයක් සඳහා | ගෙවිය යුතු බදු ප්‍රමාණයෙන් රු. මිලියන 5.0 ක් අඩු කිරීම<br>හෝ<br>2016.11.10 දිනැති අංක 1992/29 දරන ගැසට් නිවේදනයේ සහ එයට කරන ලද 2017.06.09 දිනැති අංක 2022/30 දරන සංශෝධිත ගැසට් නිවේදනයේ නිශ්චිතව සඳහන් ගෙවිය යුතු නිෂ්පාදන බදු අනුපාතය<br>යන දෙකෙන් බලපත්‍රලාභියාගේ අභිමතය පරිදි |
| 03. | රජයේ නිලධාරියකු විසින් 2016.10.31 දිනැති අංක 210(III) දරන චක්‍රලේඛය සහ එයට කරන ලද සංශෝධන අනුව විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් උපයෝගී කරගෙන, 2017.11.09 දින හෝ ඊට පෙර ණයවර ලිපිය විවෘත කර ආනයනය කරන ලද සහ 2018.04.30 දින හෝ ඊට පෙර ශ්‍රී ලංකා රේගුවෙන් නිෂ්කාශනය කර ගන්නා ලද වාහනයක් සඳහා | ගෙවිය යුතු බදු ප්‍රමාණයෙන් රු. මිලියන 5.0 ක් අඩු කිරීම<br>හෝ<br>2016.11.10 දිනැති අංක 1992/29 දරන ගැසට් නිවේදනයේ සහ එයට කරන ලද 2017.07.11 දිනැති අංක 2027/7 දරන සංශෝධිත ගැසට් නිවේදනයේ නිශ්චිතව සඳහන් ගෙවිය යුතු නිෂ්පාදන බදු අනුපාතය<br>යන දෙකෙන් බලපත්‍රලාභියාගේ අභිමතය පරිදි |

03 - 219

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.